

# “මා වෙනුවෙන් **රජෙකු** මැරෙන්නට තරම් මා කවුද?”

සැකසුම; වොට්සන් ගුඩ්මන්

නොමිලයේ. විකිණීමට 'නොවෙ.

# මා කව්ද?

අප කවුද කියා අප මැවුම්කරු දන්නාසේක. දෙවියන්වහන්සේගේ මුදගැනීම පිළිගත් කළ උන්වහන්සේගේ සදකාල වචනය තුළින් ''අප කවුරු ලෙස මවා තිබේද'' ''අපට කුමක් සිදුවීද'' ''එය අපව කොහේ ගෙනයයිද'' සහ ''අපට කවුරු ලෙස විය හැකිද'' යන්න දැනගත හැකිය.

සමහරු දෙවියන්වහන්සේගේ මුදගැනීම නොදනිති. මෙහි කොටසක් පමණක් දත් අය උත්සහවන්තව, ඕනෑකමින් එය සෙවිය යුතුයි. දෙවියන්වහන්සේගේ මුදගැනීමට එරෙහිව ඇතැම්හු සටන් කරති. මෙම මිදීම ආදරයෙන් වැළඳගත් අය ඉන්පසු, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ උදර සදකාලික ස්ථානයක් ඇති පුද්ගලයන් බවට පත්ව ඇත.

මාගේ මැවුම්කරු තුළ ඇති මාගේ සදකාල ආත්මයේ වටිනාකම ඇත්තේ, එය උන්වහන්සේට හැඩගැස්සීමට දෙන දෙය අනුවය. දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කළ විට එහි නොවටිනා ප්‍රතිඵලය නිසා සදකාලය අපායේ ගත කිරීමට සිදුවෙයි. දෙවියන්වහන්සේව පිළිගෙන උන්වහන්සේට කීකරුවූ කල උන්වහන්සේගේ විශ්වයේ සිංහාසනය බෙදගන්නා උන්වහන්සේගේ මනාලියන් ලෙස අප පත් කරනසේක!

— වොට්සන් ගුඩ්මන්

# මිනිසා මැවීමේ දෙවියන්වහන්සේගේ ප්‍රධාන අරමුණ 

## උන්වහන්සේට සදාකාල මනාලියක් තබාගැනීම

යෙසායා 62 : 5 ආ

......මනාලයා මනාලිය කෙරෙහි ප්‍රීති වන්නාක් මෙන් නුඹේ දෙවියන්වහන්සේ නුඹ කෙරෙහි ප්‍රීති වනසේක.

මතෙව් 25 : 1 සහ 6

එකල තමුන්ගේ පහන් ගෙන මනාලයාගේ පෙරමගට ගිය කන්‍යාවන් දස දෙනෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කරනු ලැබේ. . . මධ්‍යම රාත්‍රියේ: අන්න, මනාලයා එනවා! ඔහුගේ පෙරමගට එන්න යයි හඬක් වූයේය.

**මනාලයා — ක්‍රිස්තුස්වහන්සේය**

යොහන් 3 : 29 අ

මනාලිය ඇත්තා මනාලයාය. නුමුත් මනාලයා ළඟ සිට ඔහුගේ වචන අසන ඔහුගේ මිත්‍රයා මනාලයාගේ හඬට බොහෝ සෙයින් ප්‍රීතිවෙයි.

2 කොරින්ති 11 : 2

මක්නිසාද පිරිසිදු කන්‍යාවක මෙන් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ වන එක පුරුෂයෙකුට පාවාදීම පිණිස මා විසින් විවාහබස් දුන් බැවින් දිව්‍ය වූ ජ්වලිතයකින් නුඹලා ගැන මම ජ්වලිතව සිටිමි.

මතෙව් 9 : 15

යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට: මගුල් ගෙදර අය සමග මනාලයා සිටින තුරු ඔවුන්ට ශෝකවන්ට හැකිද? නුමුත් මනාලයා ඔවුන්ගෙන් අහක්කරන දවස් පැමිණෙන්නේය, එකල ඔවුන් නිරාහාරව සිටිනවා ඇත.

# මෙනිසා දෙවියන්වහන්සේ සිය රූපයට මිනිසා මැවූසේක

**මීට වඩා පහත් මැවිල්ලකට උන්වහන්සේගේ මනාලිය වීමට නුපුළුවන**

උත්පත්ති 1 : 27

දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක; දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක. පුරුෂයාද, ස්ත්‍රියද ලෙස ඔවුන් මැවූසේක.

එපීස 1 : 4

ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාදවලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක.

**දෙවියන්වහන්සේගේ සහභාගිකමට සුදුසුය**

. . . දේව ස්වභාවයට පංගුකාරයන් වන පිණිසය (2 පේත්‍රුස් 1 : 4ආ). . . . එළිදරව්වෙන්ට තිබෙන තේජසට පංගුකාරයෙක්ද . . . (1 පේත්‍රුස් 5 : 1ආ). එනම්, ශුභාරංචිය කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ . . . පොරොන්දුවට හවුල්කාරයන් බවත්ය (එපීස 3 : 6). ආලෝකයේ ශුද්ධවන්තයන්ගේ උරුමයන් කොටසකට අප සුදුස්සන් කළාවූ. . . (කොළොස්සි 1 : 12අ). . . . ප්‍රයෝජන ලබන්නෝ, ඇදහිලිවන්තයන්ද, ප්‍රේමවන්තයන්ද වන බැවින් . . . (1 තිමෝති 6 : 2 ආ). . . . අපි ක්‍රිස්තුස්වහන්සේගේ පංගුකාරයෝ වී සිටිමුව (හෙබ්‍රෙව් 3:15ආ). ශුද්ධාත්මයාණන්වහන්සේට පංගුකාරයන් වුණාවූ. . . (හෙබ්‍රෙව් 6 : 4ආ). . . . නුමුත් උන්වහන්සේ තමන්ගේ ශුද්ධකමට අප පංගුකාරයන් වන පිණිස . . . (හෙබ්‍රෙව් 12 : 10 ආ).

උත්පත්ති 9 : 6අ

දෙවියන්වහන්සේ තමන්ගේ ස්වරූපයෙන් මනුෂ්‍යයා සෑදූ බැවින්. . .

ක්‍රියා 17 : 24අ,25ආ,26ආ,27 — 29: ලෝකයද, එහි ඇති සියල්ලද මැවූ දෙවියන්වහන්සේ. . උන්වහන්සේම සියල්ලන්ට, ජීවිතයද, හුස්මද සියලු දේවල්ද, දෙනසේක. . . මුළු පොළෝ තලේ වාසය කරන පිණිස එක්කෙනෙකුගෙන් ඔවුන් මැවූසේක. මෙසේ කළේ අතගා යමින් යම් අන්දමකින් දෙවියන්වහන්සේව සම්භවන ලෙස ඔවුන් තමන්වහන්සේව සොයන පිණිසය; එහෙත් උන්වහන්සේ අප එකිනෙකාට නුදුරුව සිටිනසේක. මක්නිසාද අපි උන්වහන්සේ තුළ ජීවත් වමුව, හැසිරෙමුව, සිටිමුව. තවද අපි උන්වහන්සේගේ දරුවෝයයි, නුඹලාගේ කාව්‍යක්කාරයන්ගෙන් සමහරෙක් පවා කියා තිබේ. එනිසා දෙවියන්වහන්සේගේ දරුවන් වූ අප විසින් දේවත්වය වනාහි මනුෂ්‍ය ශිල්පයෙන් හා සමර්ථකමින් කැපූ රනටවත්, රිදියටවත්, ගලටවත් සමානයයි නොසිතිය යුතුය.

**දෙවියන්වහන්සේගේ ස්වරූපයට සෑදූ ආදම්ගෙන් දෙවියන්වහන්සේගේ හා සමාන තේජසක් විහිදෙන්ට ඇත**

1 රාජාවලිය 8 : 11

වලාපටලය නිසා පූජකයන්ට සේවය කිරීම පිණිස සිටින්ට නොහැකි විය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ තේජසින් ස්වාමින්වහන්සේගේ ගෘහය පිරුණේය.

# ශුද්ධත්වයෙන් පාපයට හා අන්ධකාරයට

## ශුද්ධවූ දෙවියන්වහන්සේට සමානව සාදන ලදී

1 පේත්‍රුස් 1 : 16

මක්නිසාද මා ශුද්ධව සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය යුතුයයි ලියා තිබේ.

## අකීකරුකම වෙන්වීම ඇති කළේය

රෝම 5 : 19

මක්නිසාද එක් මනුෂ්‍යයකුගේ අකීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා පව්කරුන් කරනු ලැබූ සේම, එක්කෙනෙකුගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨ කරනු ලබන්නෝය.

රෝම 3 : 23

මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.

## දූන් රැවටිලිකාරය - දුෂ්ඨය

යෙරෙමියා 17 : 9

සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ. එය දුෂ්ඨව තිබේ. එය කාහට දැනගන්නට පුළුවන්ද?

## දෙවියන්වහන්සේ දුෂ්ඨයාව ප්‍රතික්ෂේප කරනසේක

ලූක් 13 : 27 ආ

. . . නුඹලා කොතැනින් ආවාද කියා නොදනිමි. අයුතුකම් කරන සියල්ලෙනි, මා වෙතින් යත්වා යයි කියන්නේය.

## මිනිසා අඳුරෙහි නැති වී සිටියි

යොහන් 3 : 19

විනිශ්චය නම් : ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නුමුත්, මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවයි.

### වැටුණාවූ මාංසය අපවිත්‍රය

යෙසායා 64 : 6

අපි සියල්ලෝම අපවිත්‍ර කෙනෙකු මෙන් වී සිටිමුව; අපේ සියලුම ධර්මිෂ්ඨකම්ද කිලුටු වස්ත්‍රයක් මෙන්ය. අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව; අපේ අයුතුකම්ද සුළඟ මෙන් අප පහකරගෙන යයි.

### සදාකාල මරණය මා කෙරෙහිය

රෝම 5 : 12

එහෙයින් එක් මනුෂ්‍යයකු කරණකොට ගෙන පාපයත්, පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන් සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුණේය.

### මා වරදට පත්කර ඇත

රෝම 5 : 18 අ

එබැවින් එක වරදක් කරණකොටගෙන දඬුවමට පත්කිරීම පිණිස විනිශ්චය සියලුම මනුෂ්‍යයන් කෙරෙහි පැමුණුනාක් මෙන්ම, එක ධර්මිෂ්ඨ ක්‍රියාවක් කරණකොටගෙන ජීවනයේ ධර්මිෂ්ඨ කිරීම පිණිස දීමනාව සියලු මනුෂ්‍යයන් කෙරෙහි පැමුණුනේය.

### පාපය මා වහල් කරගෙන ඇත

රෝම 7 : 23

නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධ කරන්නාවූ, මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල්කමට පමුණුවන අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ.

### පාපය දෙවියන්වහන්සේගෙන් වෙන් කරයි

යෙසායා 59 : 2අ

නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක් ඇති කළේය.

# මා කවද?

## වැටුණාවූ මාංසයේ මා මැටි, තණ හා වාෂ්ප මෙන්ය

යෙසායා 64 : 8

ඉතින් ස්වාමින්වහන්ස, ඔබ අපේ පියාණෝය, අපි මැටිය; ඔබ අපේ කුම්භකාරයාණෝය; අප සියල්ලන් ඔබගේ හස්ත කර්මාන්තයන්ය.

1 පේත්‍රුස් 1 : 24

මාංසමය වූ සියල්ලෝම තණකොළ මෙන්ය, ඔවුන්ගේ මුළු තේජස තණමල සේය. තණකොළ වියළීයයි, මල් වැටේ.

යාකොබ් 4 : 14

මක්නිසාද හෙට මක්වේද කියා නුඹ දන්නේ නැත. නුඹලාගේ ජීවිතය කුමක්ද? නුඹලා ස්වල්ප වේලාවක් පෙනී පසුව නොපෙනී යන මීදුමක්ය.

## ක්‍රිස්තුන්වහන්සේ තුළ අමරණීය භාවය හා සදකාල ජීවනය මට ලබාගැනීමට පුළුවන

යොහන් 11 : 26

ජීවත්ව සිටින කවුරු නුමුත් මා කෙරෙහි අදහාගන්නේද, ඔහු කිසි කලෙකත් නොනසින්නේය. මෙය ඔබ විශ්වාස කරන්නෙහිද?

1 යොහන් 5:10,11

දෙවියන්වහන්සේගේ පුත්‍රයා කෙරෙහි අදහන්නාට තමා තුළම සාක්ෂිය ඇත. දෙවියන්වහන්සේ තමන් පුත්‍රයාණන් ගැන දී තිබෙන සාක්ෂිය කෙරෙහි විශ්වාස නොකළ නිසා උන්වහන්සේව බොරුකාරයෙක් කෙළේය. ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට සදකාල ජීවනය දුන් බවය. ඒ ජීවනයද තමන් පුත්‍රයාණන් තුළ තිබේ.

ගීතාවලිය 24 : 7 – 10

වාරයෙනි, ඔබගේ හිස් ඔසවව්; සදාකාල වාරයෙනි, උස්වව්. තේජසේ රජ ඇතුල් වනසේක. තේජසේ රජ කවුද? බලපරාක්‍රම ස්වාමින්වහන්සේය. යුද්ධයෙහි බලසම්පන්න ස්වාමින්වහන්සේය. වාරයෙනි, ඔබගේ හිස් ඔසවව්, එසේය සදාකාලික වාරයෙනි හිස් ඔසවව්, තේජසේ රජ ඇතුල් වනසේක. මේ තේජසේ රජ කවුද? සේනාවල ස්වාමින්වහන්සේය. තේජසේ රජ උන්වහන්සේය.

1 තිමෝති 6 : 13 අ 15,16

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශවීම දක්වා. . . ශුභාන්විත එකම අධිපතියාණන්වහන්සේ වන රජුන්ගේ රජ හා ස්වාමින්ගේ ස්වාමිව සිටින එකම අමරණීය වූ, කිසිවෙකුට ළඟාවෙන්නට බැරි ආලෝකයෙහි වසන්නාවූ, කිසි මනුෂ්‍යයකු විසින් නුදුටුවාවූ දකින්ටත් බැරිවූ තැනැන්වහන්සේ ඒ ප්‍රකාශවීම නියම කාලවලදී පෙන්වනවා ඇත. උන්වහන්සේට ගෞරවයත්, සදාකාල පරාක්‍රමයත් වේවා. ආමෙන්.

**මෙම රජ මුළු පොළෝතලයටම රජව සිටිනසේක**

සෙකරියා 14 : 8,9

ඒ දවසේ ජීවන වතුර යෙරුසලමෙන් නික්ම, එයින් කොටසක් නැගෙනහිර මුහුදටත්, කොටසක් බස්නාහිර මුහුදටත් ගලායනවා ඇත. ග්‍රීෂ්ම කලද, සීත කලද, එසේ වන්නේය. ස්වාමින්වහන්සේ මුළු පොළොව කෙරෙහි රජව සිටිනවා ඇත. එකල ස්වාමින්වහන්සේ පමණක් දෙවිව සිටිනවා ඇත; උන්වහන්සේගේ නාමය පමණක් ඇති වන්නේය.

# යේසුස්වහන්සේ සිය රාජත්වය ප්‍රකාශ කරති

යොහන් 18 : 36,37

යේසුස්වහන්සේ උත්තර දෙමින්: මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ. මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධ වී නම් යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන පිණිස මාගේ සේවකයන් සටන් කරනවා ඇත. නුමුත් දැන් මාගේ රාජ්‍යය මෙලොවින් නොවේයයි කීසේක. එබැවින් පිලාත් : එසේ වී නම්, නුඹ රජෙක්දැයි උන්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්වහන්සේ උත්තර දෙමින් : මම රජෙක් යයි නුඹ කියනවා හරිය. ඒ පිණිස මම ඉපිද සිටිමි. මම ලෝකයට පැමිණ සිටින්නේ සත්‍යයට සාක්ෂි දෙන පිණිසය. සත්‍යයෙන්වූ සියල්ලෝ මාගේ හඬ අසතියි කීසේක.

මාර්ක් 14 : 61,62

නුමුත් උන්වහන්සේ කථා නොකර, කිසි පිළිතුරක් නොදී සිටිසේක. යළි උත්තම පූජකයා කථා කොට: නුඹ ආශිර්වාදලත් තැනැත්වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස්වහන්සේ දැයි උන්වහන්සේගෙන් ඇසීය. යේසුස්වහන්සේද: එසේය, තවද මනුෂ්‍ය පුත්‍රයා පරාක්‍රමයේ දකුණු පැත්තේ වැඩ ඉන්නවාත් අහසේ වළාකුල් පිරිවරාගෙන එනවාත් නුඹලා දකින්නහුයයි කීසේක.

මතෙව් 25 : 31 සහ 34

මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් හා සිය තේජසින් එන කල, තම තේජසේ සිංහාසනයේ වැඩහිඳිනසේක... එවිට රජ තම දකුණත සිටින්නන්ට කියනසේක්: මාගේ පියාණන්ගේ ආශිර්වාද ලත්තෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම්කර තිබෙන රාජ්‍ය උරුමකරගන්න.

හෙබ්‍රෙව් 1 : 8

නුමුත් පුත්‍රයා ගැන කතාකොට: දෙවියන්-වහන්ස, ඔබගේ සිංහාසනය සදකාලේටම පවත්නේය, ඔබගේ රාජ්‍යයේ ජයකොන්-තය යුක්තියේ ජයකොන්තයක්ය.

දනියෙල් 4 : 37

දන් නෙබුකද්නෙසර් වන මම ස්වර්ගීයේ රජුන්ට වර්ණනාද, ප්‍රසංසාද, ගෞරවයද, කරමි; මක්නිසාද උන්වහන්සේගේ සියලුම ක්‍රියා සැබෑය, උන්වහන්සේගේ මාවත්ද ධර්මිෂ්ඨය. උඩඟුකමින් හැසිරෙන්නන් පහත් කිරීමට උන්වහන්සේට පුළුවන.

මතෙව් 18 : 3,4

සැබවක් නුඹලාට කියමි, නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නුණොත් කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නහුය. එබැවින් මේ කුඩා දරුවා මෙන් යටත්වන කවුරු නුමුත් ස්වර්ග රාජ්‍යයෙහි ඉතා උතුම් තැනැත්තෙක්ය.

එළිදරව් 11 : 15ආ

. . . ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමීන්වහන්සේටද, තමන් ක්‍රිස්තුස්-වහන්සේටද විය. උන්වහන්සේ සදහට රජ කරනසේක.

එපීස 1 : 18,19

උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියාත්, ශුද්ධවන්ත-යන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත්, අදහන්-නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැන-ගන්න පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය.

# තේජසේ රජුගේ විශේෂ ලක්ෂණ

යොහන් 17 : 2අ

ඔබගේ පුත්‍රයාට ඔබ දුන් සියල්ලන්ට ඔහු විසින් සදාකාල ජීවනය දෙන පිණිස ඔබ සියලු මනුෂ්‍යයන් කෙරෙහි ඔහුට බලය දුන් ලෙස. . .

1 පේත්‍රුස් 3 : 22

උන්වහන්සේ ස්වර්ගයට ගොස් දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ සිටිනසේක; දේවදූතයෝද, බලය ලත්තෝද, පරාක්‍රම ධාරීහුද උන්වහන්සේට යටත් කරන ලද්දෝ වෙති.

එපීස 1 : 20 – 23

උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ඨ කළාවූ සිය පරාක්‍රමයේ ශක්තියේ ක්‍රියා කිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා, සියලු අධිපති-කමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස් කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණත හිඳුවා, සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත් කොට සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා ලෙස උන්වහන්සේව නියම කළසේක. ඒ සභාව නම් සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණ කරන තැනැන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයය.

යොහන් 17 : 23

මෙසේ කළේ මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත්, ඔබ මා එවූ බවද මට ප්‍රේම කළ ලෙස ඔවුන්ටත් ප්‍රේම කළ බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය.

එළිදරව් 5 : 12ආ

මරනු ලැබූ බැටළුපැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රසංසාවත් ලබන්ට වටින තැනැන්වහන්සේයයි මහත් හඬින් කීහ.

මතෙව් 28 : 18

යේසුස්වහන්සේ ඔවුන් ළඟට පැමිණ කථාකොට : ස්වර්ගයේද පොළොවේද සියලු බලය මට දී තිබේ.

1 කොරින්ති 8 : 6

අපට ඇත්තේ එකම දෙවි කෙනෙක් වන පියාණන්වහන්සේය. සියල්ල පැමිණ තිබෙන්නේ උන්වහන්සේගෙන්ය; අපිත් උන්වහන්සේ උදෙසාය. තවද අපට ඇත්තේ එක ස්වාමින්වහන්සේය. එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. සියල්ල උන්වහන්සේ කරණකොටගෙනය, අපිත් උන්වහන්සේ කරණකොටගෙනය.

1 කොරින්ති 1 24

නුමුත් කැඳවනු ලැබූ යුදෙව්වරුන්ට සහ ග්‍රීක්වරුන්ට දෙවියන්වහන්සේගේ බලය සහ දෙවියන්වහන්සේගේ ප්‍රඥාවත්ය.

එළිදරව් 11 : 17

සිටින්නාවූ, සිටියාවූ, එන්ට සිටින්නාවූ සර්වපරාක්‍රම ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ මහත් බලය රැගෙන ඔබ රජකම් කළ බැවින් අප ඔබට ස්තුති කරමුව.

කොලොස්සි 2 : 2,3

ඒ වනාහි ඔවුන් ප්‍රේමයෙහි සම්බන්ධ වී, තේරුම්ගැනීමේ සම්පූර්ණ සහතිකය නැමති සියලු සම්පත භුක්තිවිඳිමින්, ඔවුන්ගේ සිත් සනසනු ලබන පිණිසත් දෙවියන්වහන්සේගේ රහස වන ක්‍රිස්තුස්වහන්සේ දැනගන්නා පිණිසත්ය. ඒ තැනැන්වහන්සේ තුළ ප්‍රඥාවෙත් දැනගැන්මෙත් සියලු වස්තු නිධානකර ඇත්තේමය.

# තේජසේ රජුගේ අනාගතය

### ගීතාවලිය 72 : 8 සහ 11

උන්වහන්සේ මුහුදෙන් මුහුදටත්, ප්‍රාත් ගංගාව පටන් පොළොවේ කෙළවර දක්වාත් අධිපතිකම් කරන්නේය. . . . . එසේය, සියලු රජවරු උන්වහන්සේ ඉදිරියෙහි වැඳ වැටෙන්නෝය. සියලු ජාතීහු උන්වහන්සේට මෙහෙකරන්නෝය.

### ගීතාවලිය 2 : 2 – 4 සහ 6 – 8

ස්වාමීන්ටද, උන්වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තානන්ටද විරුද්ධව පොළොවේ රජවරු සැරසෙති. අධිපතියෝද එක්ව මන්ත්‍රණය කරති. අපි ඔවුන්ගේ බැමි කඩා දමා, ඔවුන්ගේ ලණු අප කෙරෙන් ඉවත ලමුයයි කියති. ස්වර්ගයෙහි සිටින තැනැන්වහන්සේ සිනාසෙනසේක. ස්වාමීන්වහන්සේ ඔවුන්ට පරිහාස කරනසේක. . . මම සියොන් නම් මාගේ පිරිසිදු කන්ද මත, මාගේ රජ්ජුරුවන් පිහිටිමියි කියනසේක. මම නියමය ප්‍රකාශ කරන්නෙමි. ස්වාමීන්වහන්සේ මට කථාකර : නුඹ මාගේ පුත්‍රයාය; අද නුඹව ජනිත කෙළෙමි. මාගෙන් ඉල්ලන්න, එවිට නුඹේ උරුමයට ජාතීන්ද, නුඹේ කොටසට පොළොවේ සීමාව දක්වා දෙන්නෙමි.

### යෙරෙමියා 10 : 7 සහ 10අ

මක්නිසාද, හයවිය යුතු ඔබටය. කුමක් හෙයින්ද, ජාතීන්ගේ සියලු ප්‍රඥාවන්තයින් අතරේද, ඔවුන්ගේ සියලුම රාජශ්‍රීයෙහිද ඔබට සමාන වූ කෙනෙක් නැත. . . . . ස්වාමීන්වහන්සේ සැබෑවූ දෙවියන්වහන්සේය; උන්වහන්සේ ජීවමාන දෙවි කෙනෙකි; සදාකාල රජෙකි.

යෙසායා 42 : 8

මම ස්වාමින්වහන්සේය; මාගේ නාමය එයයි. මාගේ ගෞරවය අන් කෙනෙකුට හෝ මාගේ ප්‍රසංසාව රූපවලට හෝ නොදෙන්නෙමි.

ගීතාවලිය 95 : 3

මක්නිසාද ස්වාමින්වහන්සේ මහත් දෙවි කෙනෙකි. සියලු දෙවිවරුන්ට වඩා මහත් රජ කෙනෙකි.

මතෙව් 24 : 30

එවිට මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණු අහසේ පෙනෙන්නේය. . . . ඔවුහු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද, මහත් තේජසින්ද, අහසේ වළාකුල් පිට එනවා දකින්නේය.

එළිදරව් 4 : 11

අපගේ දෙවියන්වහන්ස, ඔබ ප්‍රසංසා-වත් ගෞරවයත් බලයත් ලබන්ට වටින තැනැන්වහන්සේය. මක්නිසාද ඔබ සියලු දේ මැවූසේක, ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය; තවද, ඒවා මවන ලද්දේය.

1 තිමෝති 1 : 17

ඉතින් අමරණීය, අදෘශ්‍යමාන, එකම දෙවි වූ සදාකාල රජුට ගෞරවයද, තේජසද, සදාකාලයටම වේවා. ආමෙන්.

## උන්වහන්සේගේ තේජස මනාලිය සමග බෙදාගන්නාසේක

යොහන් 17 : 22

අප ඒකත්වයක්ව සිටින්නා සේම, ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි.

රෝම 8 : 18

මක්නිසාද මේ වර්තමාන කාලයේ දුක් අප කෙරෙහි එළිදරව් කරනු ලබන්නාවූ මහිමයට සමාන කරනු ලබන්ට නොවටියයි සිතමි.

# මැවුම්කාර රජ ආඥාධිපතිය

යෙසායා 9 : 7ආ

. . . උන්වහන්සේගේ ආණ්ඩුවේ විශාලත්වයටත් සමාදනයටත් කෙළවරක් නොවන්නේය. . .

යෙසායා 45 : 9අ, 10 – 13 අ

තම මැවුම්කරු සමග පොරට සිටින්නාට දුක්වේ! . . . නුඹ ජාතක කරන්නේ මොකක්දැයි පියෙකුටවත්, නුඹ වදන්නේ කුමක්දැයි ස්ත්‍රියෙකුටවත්, කියන්නාට දුක්වේ. ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේද ඔහුගේ මැවුම්කාරයාද වූ ස්වාමින්වහන්සේ මෙසේ කියනසේක: මතු පැමිණෙන දේ ගැන මාගෙන් අසන්න. මාගේ පුත්‍රයන් ගැනද, මාගේ අතේ ක්‍රියාවල් ගැනද මට අණ කරන්න. පොළොව සාද ඒ පිට මනුෂ්‍යයා මැව්වේ මමය. මා විසින්, එසේය, මාගේ අත්වලින් අහස විදහන ලද්දේය, මම එහි මුළු සේනාවට ආඥා කළෙමි. ඔහු ධර්මිෂ්ඨකමින් නැගිටුවේ මමය. ඔහුගේ සියලු මාර්ග සමතලා කරන්නෙමි.

දනියෙල් 7 : 14

සියලු ජනයන්ද, ජාතීන්ද භාෂාවන්ද උන්වහන්සේට සේවය කරන පිණිස ආණ්ඩු බලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේගේ ආණ්ඩුව පහ නොවන සදකාල ආණ්ඩුවක්ය, උන්වහන්සේගේ රාජ්‍යයද නැති නොවන්නේය.

## උන්වහන්සේගේ අණට යටත් වෙන්න

ගීතාවලිය 72 : 11

එසේය, සියලු රජවරු උන්වහන්සේ ඉදිරියෙහි වැඳ වැටෙති. සියලු ජාතීහු උන්වහන්සේට මෙහෙ කරන්නෝය.

### ස්ථානය, මැරෙණ අන්දම හා නැවත නැගිටීම ගැන අනාවැකි කීසේක

මතෙව් 20 : 18, 19

මනුෂ්‍ය පුත්‍රයා නායක පූජකයන්ටත් ලියන්නන්ටත් පාවාදෙනු ලබන්නේය; ඔවුහු ඔහු මරණයට නියමකර කවටකම් කිරීමටත්, තැළීමටත්, කුරුසියෙහි ඇණ ගැසීමටත්, අන්‍ය ජාතීන්ට පාවා දෙන්නෝය. නුමුත් තුන්වනදා ඔහු නැගිටවනු ලබන්නේයයි කීසේක.

### දෙවියන්වහන්සේ ඉදිරිපිට පාපය දරුණුව ඇති නිසා මෙම පිළියම අවශ්‍ය විය

1 පේතෘස් 3 : 18

මක්නිසාද දෙවියන්වහන්සේ ළඟට අප පමුණුවන පිණිස ධර්මිෂ්ඨවූ ක්‍රිස්තුස්වහන්සේ අධර්මිෂ්ඨයන් උදෙසා පව් ගැන වරක් වධ වින්දසේක; උන්වහන්සේ මාංසය සම්බන්ධයෙන් මරනු ලැබ ආත්මය සම්බන්ධයෙන් ජීවත් කරනු ලැබූසේක.

ගලාති 1 : 3ආ, 4

. . . අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ. . . දැන් තිබෙන නපුරු ලෝකයෙන් අප ගළවන පිණිස, අපගේ පියවූ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස අපේ පව් නිසා තමන්ම පාවා දුන්සේක.

1 යොහන් 3 : 16අ

අප දෙවියන්වහන්සේගේ ප්‍රේමය දන සිටින්නේ ඒ තැනැන්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයින්ය.

1 කොරින්ති 1 : 18

කුරුසියේ වචනය, විනාශ වන්නන්ට මෝඩකමක්ය; නුමුත් ගැළවෙන්නාවූ අපට එය දෙවියන්වහන්සේගේ බලයය.

# අනගි ලෙය–අනගි ගැලවුම්කරු

එපිස 2 : 13

නුමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ උන්වහන්සේගේ ලෙය කරණකොටගෙන ළං කරනු ලැබුවහුය.

හෙබ්‍රෙව් 10 : 19,20අ

එබැවින් . . . නව ජීවමාන මාර්ගයකින් උන්වහන්සේගේ ලෙය කරණකොටගෙන ශුද්ධ ස්ථානයට ඇතුල්වීමට අපට නිදහස තිබේ. . .

හෙබ්‍රෙව් 13 : 20අ

ඉතින් සදාකාල ගිවිසුමේ ලෙය කරණකොටගෙන . . .

කොලොස්සි 1 : 19ආ

. . . උන්වහන්සේගේ කුරුසියේ ලෙයින් සමාදනය උපදවා . . .

එළිදරව් 1 : 5ආ

. . . අපට ප්‍රේමකර, තම ලෙයින් අප පාපයෙන්, අප මිදූ තැනන්වහන්සේට . . .

1 පේත්‍රුස් 2 : 6,7ආ

බලව, තෝරාගත් අනර්ග කොනේ ප්‍රධාන ගලක් සියොන්හි තබමි. උන්වහන්සේ අදහාගන්නා ලජ්ජාවට නොපැමිණෙන්නේය. . . එබැවින් අදහන්නාවූ නුඹලාට ඒ ගෞරවය ඇත්තේය.

**මනාලයා ඔහුගේ මනාලිය සොයයි**

ලූක් 19 : 10

මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දෙය සොයන්ටද, ගළවන්ටද, ආයේයයි කීසේක.

# දෙවන මරණයෙන් සහ අපායෙන් මා මුදන පිණිස ක්‍රිස්තුස්වහන්සේ එය පරාජය කළසේක 

**සදාකාල මරණයට මා සුදුසුය**

එසකියෙල් 18 : 4 ආ

. . . පව්කරන ප්‍රාණය නසින්නේය.

රෝම 5 : 12

එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලොවට ඇතුල් වූ සේ සියලු මනුෂ්‍යයන් පව් කළ නිසා සියල්ලන් කෙරෙහි මරණය පැමිණුනේය.

රෝම 6 : 23අ

මක්නිසාද පාපයේ කුලිය නම් මරණය . . . .

**මා නිසා මරණය පරාජය කළසේක**

2 තිමෝති 1 : 8 –10

එබැවින් අපගේ ස්වාමීන්වහන්සේගේ සාක්ෂිය ගැන . . . ලජ්ජා නොවී, දෙවියන්වහන්සේගේ බලය අනුව ශුභාරංචිය නිසා . . . දුක්විඳින්න. උන්වහන්සේ අප ක්‍රියා අනුව නොව, තමන්වහන්සේගේම අභිප්‍රායේ හා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ලොව පටන්ගැන්මටත් පෙර, අපට දෙන ලද කරුණාව අනුව අප ගළවා, ශුද්ධවූ කැඳවීමකින් කැඳවාගත්සේක. මරණය නැති කර ජීවනයත්, අමරණීයභාවයත්, ශුභාරංචිය තුළින් එළිදරව් කළ අප ගැළවුම්කරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ඒ කරුණාව දැන් ප්‍රකාශ වී තිබේ.

එළිදරව් 1 : 18

මම මැරුණෙමි. නුමුත් බලව, මම දැන් සදාකාලයටම ජීවත්ව සිටිමි, මරණයේද පාතාලයේද යතුරු මට ඇත්තේය.

# මුළු සිතින් සොයන්නන්ට,රජ, නොමිළයේ ගැලැවීම සපයා දී ඇත

1 කොරින්ති 15 : 3 ආ

. . . ලියවිලි ප්‍රකාරයට, අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණුසේක.

ක්‍රියා 20 : 28අ

උන්වහන්සේ තම රුධිරයෙන් මිළයට ගත් දෙවියන්වහන්සේගේ සභාව......

මම යහපත් බැටළු එඬේරාය. යහපත් බැටළු එඬේරා තමාගේ ජීවිතය බැටළුවන් උදෙසා දෙන්නේය. —යොහන් 10 : 11

2 කොරින්ති 5 : 15

උන්වහන්සේ සියල්ලන් වෙනුවෙන් මැරුණේ, ජීවත්වන්නන් තවත් තමන් උදෙසා ජීවත් නොවී, ඔවුන් නිසා නැසී, නැවත නැගිටි තැනැන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය . . .

ක්‍රියා 10 : 43

උන්වහන්සේ කෙරෙහි අදහන සියල්ලන්ට උන්වහන්සේගේ නාමය කරණකොටගෙන පාප කමාව ලැබෙන බවට සියලු අනාගතවක්තෘවරු උන්වහන්සේ ගැන සාක්ෂි දෙතියි කීවේය.

2 පේත්‍රුස් 3 : 9

ප්‍රමාදයයි සමහරුන් සළකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දු ගැන ප්‍රමාද නොවනසේක; නුමුත් සියල්ලන් පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශ වෙනවාට උන්වහන්සේ අකමැතිව නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසනසේක.

නුඹලා මා සොයනවා ඇත. නුඹලාගේ මුළු සිතින් මා සොයන කල මා නුඹලාට සම්භවෙනවා ඇත. —යෙරෙමියා 29 : 13

ගීතාවලිය 45 : 6, 7 අ

දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය සදාකාලේටම පවතින්නේය. ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය සාධාරණකමේ ජයකොන්තයක්ය. ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රියව, දුෂ්ටකමට ද්වේශ කළසේක. . . .

1 කොරින්ති 6 : 9 අ

අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද?. . .

රෝම 8 : 5 – 9

මක්නිසාද මාංසික ලෙස සිටින්නෝ මාංසික දෙයටද, ආත්මික ලෙස සිටින්නෝ ආත්මික දෙයටද ඇලුම් වෙති. මාංසයේ ඇල්ම මරණයයි. නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදනයයි. කුමක් හෙයින්ද මාංසයේ ඇල්ම දෙවියන්වහන්සේට සතුරුකමය; එය දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් නැත. යටත් වෙන්ටත් බැරිය. මෙසේ මාංසයේ සිටින්නන්ට දෙවියන්වහන්සේ සතුටු කරන්ට නොහැකිය. නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වාසය කරනසේක් නම් නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත.

යාකොබ් 4 : 4

කාමමිථ්‍යාචාරික, චාරිකාවෙනි, ලොව සමග මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා නොදන්නෙහිද? කවරෙකු හෝ ලොව සමග මිත්‍රව සිටියි නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙකි.

# රජ කෙසේ පිළිගනිත්ද?

හිතෝපදේශ 28 : 13

තම වරද සඟවන්නා සඵල නොවන්නේය. නුමුත් ඒවා කියා දී අත්හරින්නාට කරුණාව තිබේ.

1 යොහන් 4 : 16

දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමය, අපි දැන විශ්වාසකර සිටිමුව. දෙවියන්වහන්සේ ප්‍රේමයයි. ප්‍රේමයෙහි පවතින්නා දෙවියන්වහන්සේ තුළ සිටී; දෙවියන්වහන්සේද ඔහු තුළ සිටිනසේක.

යොහන් 1 : 12

නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේව පිළිගත්තේද . . . ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක.

යොහන් 13 : 20 ආ

. . . මා පිළිගන්නා මා එවූ තැනැන්වහන්සේව පිළිගන්නේය.

ක්‍රියා 8 : 36,37

ඔව්හු මාර්ගයේ යද්දී වතුර තිබුණු තැනකට ආහ. නපුංසකයා: මෙන්න, වතුර තිබේ. බෞතීස්ම කරනු ලබන්ට මට කවර බාධාවක් තිබේද? පිලිප් කථාකර: නුඹ නුඹේ මුළු සිතින් අදහන්නෙහි නම්, එසේ පුළුවනැයි කීය.

1 කොරින්ති 2 : 5

එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය.

යොහන් 8 : 31

එබැවින් යේසුස්වහන්සේ තමන් අදහගත් යුදෙව්වරුන්ට කියනසේක: නුඹලා මාගේ වචනයෙහි පවතිනවා නම්, සැබවින් නුඹලා මාගේ ගෝලයන්ය.

# ගැලවීම, ක්‍රිස්තුස්වහන්සේ සමග ඇති ජීවමාන සබඳතාවයක් සහ සහාභාගිත්වයක්ය 

එපීස 3 : 18

දෙවියන්වහන්සේගේ මුළු පූර්ණකමට පූර්ණ වන පිණිස . . . ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන. . . .

රෝම 8 : 10

ඉතින් ක්‍රිස්තුස්වහන්සේ නුඹලා තුළ සිටිනසේක් නම්, පාපය නිසා ශරීරය මැරී තිබෙන නුමුත් ධර්මිෂ්ඨකම නිසා ආත්මය ජීවත්වෙයි.

යොහන් 10 : 26 – 28

නුඹලා මාගේ බැටළුවන් නොවන බැවින් විශ්වාස කරන්නේ නැත. මාගේ බැටළුවෝ මාගේ හඬ අසති. මමද ඔවුන් අඳුනමි. ඔව්හු මා පස්සේ එති. මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි. ඔව්හු කිසිකලෙකත් විනාශ නොවන්නෝය. කිසිවෙක් මාගේ අතින් ඔවුන් උදුරා නොගන්නේය.

2 තිමෝති 1 : 12

ඒ කාරණය නිසා මේ දේවලුත් විඳිමි. එසේ වී නමුත් මම ලජ්ජා නොවෙමි. මක්නිසාද මා විසින් අදහාගත් තැනැන්වහන්සේ කවුද කියා මම දැනගෙන, මා උන්වහන්සේට භාරදී තිබෙන දේ ඒ දවස දක්වා ප්‍රවේසම් කරන්ට උන්වහන්සේ පොහොසත් බව විශ්වාස කරගෙන සිටිමි.

1 පේත්‍රුස් 4 : 19

එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක් විඳින්නෝ යහපත කරමින්, විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාර දෙත්වා.

# නැවත ඉපදී, ස්වාමීන්වහන්සේට සේවය කිරීමට නිදහස්ව සිටිති

1 යොහන් 5 : 5

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව විශ්වාස කරන තැනැත්තා මිස ලෝකයෙන් ජයගන්නේ වෙන කවුද?

යොහන් 1 : 13

ඔව්හු ලෙයෙන්වත් මාංසයේ කැමැත්තෙන්වත් මිනිස් කැමැත්තෙන්වත් නොව දෙවියන්වහන්සේගෙන් උපන්නෝය.

යොහන් 8 : 32

නුඹලා සැබෑව දැනගන්නේය. සැබෑවද නුඹලා නිදහස් කරන්නේ යයි කීසේක.

2 කොරින්ති 3 : 17

ස්වාමින්වහන්සේ ඒ ආත්මයාණන්වහන්සේය. ස්වාමින්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඇති තැන නිදහස ඇත.

යොහන් 8 : 36

පුත්‍රයා නුඹලා නිදහස් කරන්නේ නම් සැබවින් නුඹලා නිදහස් වෙති.

රෝම 6 : 18 සහ 22

පාපයෙන් නිදහස් කළ නුඹලා ධර්මිෂ්ඨකමේ දසයන් විය,.........දැන් නුඹලා පාපයෙන් නිදහස් කරන ලදුව, දෙවියන්වහන්සේගේ දසයෝ වී, ශුද්ධකම සඳහා ඵල දරන්නහුය; එහි කෙළවරද සදාකාල ජීවනයයි.

ගලාති 5 : 1

ක්‍රිස්තුස්වහන්සේ අප මුදගත්තේ නිදහස ඇතුව සිටීමටය. එබැවින් දසකම නැමති වියගහට නැවත අසු නොවී ස්ථිරව සිටින්න.

1 කොරින්ති 6 : 9 – 11

අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙන්න, වේශ්‍යාකම් කරන්නෝවත් රූප වඳින්නෝවත් කාමමිථ්‍යාචාරිකයෝවත් ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත් පිරිමින් සමග අනාචාර කරන්නෝවත් සොරුවත් ලෝභයෝවත් කොල්ලකන්නෝවත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුමකර නොගන්නෝය. නුඹලාගෙන් සමහරු එබන්දෝව සිටියෝය. නුමුත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්ද අපගේ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් තුළද නුඹලා සෝදනු ලැබුවහුය, ශුද්ධ කරනු ලැබුවහුය; ධර්මිෂ්ඨ කරනු ලැබුවහුය.

එළිදරව් 1 : 5ආ 6

. . . අපට ප්‍රේම කරන, තම ලෙයින් අප පාපවලින් අප මිදූ අපව රාජ්‍යයක්ද තම පිය වූ දෙවියන්වහන්සේගේ පූජකයන්ද කළා වූ තැනැන්වහන්සේට ගෞරවයද පරාක්‍රමයද සදාකාලේටම වේවා. ආමෙන්.

1 කොරින්ති 6 : 2අ

ශුද්ධවන්තයන් ලෝකයා විනිශ්චය කරන බව නොදනිමුද?

යෙසායා 62 : 3

නුඹ ස්වාමින්වහන්සේගේ අතෙහි අලංකාර ඔටුන්නක්ද, නුඹේ දෙවියන්වහන්සේගේ අතෙහි රාජ කිරීටයක්ද වන්නෙහිය.

ගීතාවලිය 145 : 18

ස්වාමින්වහන්සේ තමන්ට යාඥා කරන සියල්ලන්ට, එනම්, සැබවින් උන්වහන්සේට යාඥා කරන සියල්ලන්ට, ළංව සිටිනසේක.

2 කොරින්ති 6 : 16

දේවතාරූප සමග දෙවියන්වහන්සේගේ මාළිගාවට ඇති එකඟකම මොකක්ද? මක්නිසාද අපි ජීවමාන දෙවියන්වහන්සේගේ මාලිගාවය; එසේම දෙවියන්වහන්සේ කථාකොට : මම ඔවුන් අතරේ වාසය කරන්නෙමි. හැසිරෙන්නෙමි, මම ඔවුන්ගේ දෙවියන්වහන්සේව සිටින්නෙමි, ඔවුහුද මාගේ සෙනඟව සිටින්නෝයයි කීසේක.

1 යොහන් 1 : 3ආ

. . . එසේය, අපේ පංගුකාරකම පියාණන්වහන්සේද ස්වකීය පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද සමගය.

යෙසායා 43 : 2

නුඹ ජල මැදින් යන විට මම නුඹ සමග සිටින්නෙමි. නුඹ ගංගා මැදින් යන විට ඒවා නුඹට උඩින් ගලා යන්නේ නැත. නුඹ ගිනි මැදින් යන විට දැවෙන්නේ නැත. ගිනිදැල්ල නුඹ කෙරෙහි ඇවිළෙන්නේ නැත.

යොහන් 17 : 23

මෙසේ කළේ මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත් ඔබ මා එවූ බවද මට ප්‍රේම කළාක් මෙන් ඔවුන්ටත් ප්‍රේම කළ බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය.

# ක්‍රිස්තුස්වහන්සේ හා සැබෑ ඇදහිලිවන්තයින් අතර සම්බන්ධය

යොහන් 14 : 20

ඒ දවසේදී මා පියාණන්වහන්සේ තුළෙහිද නුඹලා මා තුළෙහිද මා නුඹලා තුළෙහිද සිටින බව නුඹලා දැනගන්නහුය.

## උන්වහන්සේගේ අන්තිම ආඥාව අප පළමු සැලකීමයි

ආත්මයාණන්වහන්සේද, මනාලියද එන්න යයි කියති. —එළිදරව් 22 : 17අ

මතෙව් 28 : 19,20

එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්ම නුඹලා සමග සිටිමි. ආමෙන්.

## ශුද්ධවන්තයින්ගේ ධර්මිෂ්ඨකම නම් ඇතුළත වාසය කරන ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකමය

කොලොස්සි 1 : 27

අන්‍ය ජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක්ද කියා දෙවියන්-වහන්සේ ශුද්ධවන්තයන්ට දන්වන්ට කැමති වූසේක; ඒ වනාහි තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේය.

රෝම 10 : 4

මක්නිසාද අදහන සියලු දෙනාටම ධර්මිෂ්ඨකම පිණිස ක්‍රිස්තුස්වහන්සේ ව්‍යවස්ථාවේ සමාපත්තිය වනසේක.

# එතරම් දයාවක්! එතරම් ප්‍රේමයක්! එතරම් කරුණාවක්!

1 පේත්‍රුස් 1 : 3අ සහ 5

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. . . ජීවන බලාපොරොත්තුවත් ලැබෙන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන, උන්වහන්සේ තමන්ගේ දයාව ලෙස අප නැවත උත්පාද කළසේක.

හෙබ්‍රෙව් 4 : 16

එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකයෙන් කරුණාවේ සිංහාසනයට ළඟා වෙමු.

එපීස 2 : 4 – 7

දෙවියන්වහන්සේ දයාවෙන් පොහොසත්ව සිටිනසේක; අපට ප්‍රේම කළ තමන්වහන්සේගේ මහත් ප්‍රේමයෙන්, අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල පවා, ක්‍රිස්තුස්වහන්සේ සමග අප ජීවත්කර (නුඹලා ගැළවී සිටින්නේ අනුග්‍රහයෙනි) උන්වහන්සේ සමග අප නැගිටවා, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල උන්වහන්සේ සමග අප හිඳවූසේක. එසේ කළේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ අප කෙරෙහි ඇති කරුණාවන්තකම නිසා තමන්වහන්සේගේ අනුග්‍රහයේ ඉතා මහත් සම්පත පැමිණෙන කාලවලදී පෙන්වන පිණිසය.

1 පේත්‍රුස් 5 : 10

එවිට ක්‍රිස්තුස්වහන්සේ තුළ තමන්ගේ සදකාල තේජසට නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ දෙවියන්වහන්සේම, නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු, නුඹලා සම්පූර්ණකර ස්ථිරකර, ශක්තිමත්කර පිහිටුවනසේක.

ගලාති 4 : 4,5

දෙවියන්වහන්සේ, ස්ත්‍රියකුගෙන් උපන්නාවූද ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද තමන් පුත්‍රයාණන්වහන්සේ එවූසේක. එසේ කළේ අප විසින් පුත්‍රකම ලබන පිණිස උන්වහන්සේ විසින් ව්‍යවස්ථාව යටතෙහි වූවන් මුදගැනීමටය.

1 යොහන් 3 : 1අ

අපි දෙවියන්වහන්සේගේ දරුවෝ යයි කියනු ලබන ලෙස පියාණන්වහන්සේ කෙබඳු ප්‍රේමයක් අපට දී වදළසේක්දැයි බලන්න.

**දෙවියන්වහන්සේගේ උරුමක්කාරයින්**

එළිදරව් 21 : 7

ජයගන්නා මේ දේවල් උරුම කරගන්නේය; මම ඔහුගේ දෙවියන්වහන්සේ වන්නෙමි, ඔහු මාගේ පුත්‍රයා වන්නේය.

ගලාති 4 : 6,7

තවද නුඹලා පුත්‍රයන්ව සිටින බැවින් අබ්බා, පියාණෙනි, කියා හඬගසන්නාවූ තමන් පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන්වහන්සේ අපේ සිත්වලට එවූසේක. මෙසේ නුඹ තවත්, දසයෙක් නොව පුත්‍රයෙක්ය; පුත්‍රයෙක් නම් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෙක්ය.

රෝම 8 : 17

තවද දරුවෝ නම් උරුමක්කාරයෝය; දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝය; ක්‍රිස්තුස්වහන්සේ සමග හවුල් උරුමක්කාරයෝය; උන්වහන්සේ සමග මහිමය ලබන පිණිස, උන්වහන්සේ සමග දුක් විඳිමු නම් මෙසේ වන්නේය.

# දෙවියන්වහන්සේගේ පුත්‍රයින්ට උන්වහන්සේගේ ස්වරූපය අධිෂ්ඨාන කළසේක

රෝම 8 : 28,29

තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව. මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියම කළසේක.

**ක්‍රිස්තුස්වහන්සේ මෙන් සේවය කරන්න,**

ලූක් 22 : 27 ආ

. . . මම වනාහි නුඹලා මධ්‍යයෙහි උපස්ථාන කරන්නා මෙන් සිටිමි.

**කමාව දෙන්න**

යේසුස්වහන්සේ කථාකර; පියාණෙනි ඔවුන්ට කමාවුව මැනව; මක්නිසාද ඔවුන් කරන්නේ කුමක්ද, ඔවුහු නොදනිතියි කීසේක. —ලූක් 23 : 34අ

**යටහත්ව මෘදුව සිටින්න**

. . . පාවුල් නම් මම ක්‍රිස්තුස්වහන්සේගේ මෘදුකම සහ මොළොක් ගුණය නිසා නුඹලාගෙන් ඉල්ලීමක් කරමි.

—2 කොරින්ති 10 : 1ආ

**ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය තුළ පවතින්න**

පියාණන්වහන්සේ මට ප්‍රේම කළාක් මෙන්ම මමත් නුඹලාට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමයෙහි පවතින්න.

—යොහන් 15 : 9

**ලොවපුරා ශුභාරංචිය පතුරුවන්න**

යේසුස්වහන්සේ : නුඹලාට සමාදනය වේවයි නැවතත් ඔවුන්ට කියා, පියාණන්වහන්සේ මා එව්වාක් මෙන්ම මමත් නුඹලා යවමියි කීසේක. — යොහන් 20 : 21

1 තෙසලෝනික 2 : 11

එසේය, තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳ වූ දෙවියන්වහන්සේට ඔබින සේ නුඹලා හැසිරෙන්න.

2 යොහන් 9

ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීමෙහි නොපැවති ඉදිරියට යන්නා වූ කිසිවෙකුට දෙවියන්වහන්සේ නැත්තේය. ඒ ඉගැන්වීමෙහි පවතින්නාට පියාණන්වහන්සේද පුත්‍රයාණන්වහන්සේද සිටිනසේක.

### උන්වහන්සේගෙන් කිසිසේත් වෙන් කිරීමට නොහැකි මනාලියක් ක්‍රිස්තුස්වහන්සේට සිටිනසේක

යාකොබ් 1 : 12

පරික්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තුගනු ලැබූ කළ තමාට ප්‍රේම කරන අයට, ස්වාමීන්වහන්සේ පොරොන්දු වූ ජීවනයේ ඔටුන්න ලැබෙන්නේය.

ලූක් 6: 47,48

මා ළඟට පැමිණ, මාගේ වචන අසා, ඒවා පවත්වන අය, කා හට සමානදැයි නුඹලාට පෙන්වමි. ඔහු ගැඹුරට හාරා, පර්වතයක් පිට අත්තිවාරම ලා, ගෙයක් සදගත් මනුෂ්‍යයෙකුට සමානය. ජල ගැල්මක් පැමිණ සැඩපාර ඒ ගෙට ගැසූ නුමුත්, එය හොඳින් ගොඩනගා තිබුණ බැවින් සොළවන්ට බැරි විය.

### උන්වහන්සේගේ අභිමුඛයට ප්‍රියවෙති

තීතස් 2 : 12ආ

. . . ආශීර්වාදලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන්වහන්සේගේ හා අපගේ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමි.

එපීස 2 : 8 – 10

මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන් නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්න පිණිස එය ක්‍රියාවලින් නොවේ. මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කිරීමට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මවනු ලැබ, දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමු. ඒ යහපත් ක්‍රියාවල අපි හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සූදනම් කළසේක.

එපීස 3 : 20,21

ඉතින් අප තුළ ක්‍රියා කරන්නාවූ බලයේ හැටියට අප ඉල්ලන නොහොත් සිතන සියලු දෙයට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇති තැනන්වහන්සේට, සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සදකල්ම ගෞරවය වේවා. ආමෙන්.

1 කොරින්ති 2 : 5

එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස, මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය.

## උන්වහන්සේ තුළ සර්ව සම්පූර්ණ කරනු ලැබේ

කොලොස්සි 2 : 9,10

උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය. සියලු අධිපතිකමේද, බලයේද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නාහුය.

**අසීමිත දේවදූත කණ්ඩායමක් විසින් නමස්කාර කරනු ලබන උන්වහන්සේ, වැටුණාවූ, කැරළිකාර මිනිසා මත තම ප්‍රේමය යොමු කරන්නේ ඇයි?**

හෙබ්‍රෙව් 1 : 6

උන්වහන්සේ තමන්ගේ කුළුඳුල් පුත්‍රයා ලොවට නැවත ගෙනෙන කළ, දෙවියන්වහන්සේගේ සියලු දූතයෝ උන්වහන්සේට නමස්කාර කරත්වායි කියනසේක.

හිතෝපදේශ 8 : 31ආ

. . . මනුෂ්‍ය පුත්‍රයින් සමීපයෙහි ප්‍රීතිවුණෙමි.

රෝම 7 : 4ආ

. . . අප විසින් දෙවියන්වහන්සේට ඵල උපදවන පිණිස නුඹලාද අන් කෙනෙකුට එනම්, මළවුන්ගෙන් නැගිටවණු ලැබූ තැනැන්වහන්සේට බැඳී ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය කරණකොටගෙන ව්‍යවස්ථාවට මළ අය කරනු ලැබුවහුය.

රෝම 12 : 4,5

යම් සේ අපට එකම ශරීරයෙහි බොහෝ අවයව තිබෙන නුමුත්, ඒ සියලු අවයවයන්ට එකම ක්‍රියාවක් නැති හෙයින්, බොහෝ දෙනෙක්වූ අපිත් ක්‍රිස්තුස්වහන්සේ තුළ එසේම එක ශරීරයක්ව, වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමුව.

**මනාලියට ජීවනය උන්වහන්සේගෙන් ලැබේ**

1 යොහන් 5 : 12

පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත. දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත.

**මනාලිය සමග සිංහාසනය බෙදගැනීම**

එළිදරව් 3 : 21

මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ සමග උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත් සේම, ජයගන්නාටත් මාගේ සිංහාසනයෙහි මා සමග ඉඳගන්ට දෙමි.

**රජුගේ නගරය සහ මනාලිය**

හෙබ්‍රෙව් 11 : 16

ස්වර්ගීයවූ රටකට ආසා ඇත්තෝය. එබැවින් දෙවියන්වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේ යයි කියනු ලබන්ට ලජ්ජා නොවනසේක. මක්නිසාද උන්වහන්සේ ඔවුන්ට නුවරක් සූදනම් කළසේක.

එළිදරව් 3 : 12අ

ජයගන්නා මාගේ දෙවියන්වහන්සේගේ මාලිගාවෙහි කණුවක් කරන්නෙමි. ඔහු තවත් එතැනින් පිටතට නොයන්නේය. මාගේ දෙවියන්වහන්සේගේ නාමයද, මාගේ දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බසින අලුත් යෙරුසලම වන මාගේ දෙවියන්වහන්සේගේ නුවරේ නාමයද, මාගේම අලුත් නාමයද ඔහු පිට ලියමි.

එළිදරව් 21: 2

තවද තමාගේ පුරුෂයාට සරසන ලද මනාලියකු මෙන් සූදනම් කරනු ලැබූ ශුද්ධ නුවර, එනම් අලුත් යෙරුසලම, දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බසිනවා දුටිමි.

එළිදරව් 22 : 14

ජීවන වෘක්ෂයට පැමිණීමට අයිතිවාසිකම් ලැබෙන පිණිසත් දොරටුවලින් නුවරට ඇතුල්වන්ට හැකි වන පිණිසත් දොරටුවලින් නුවරට ඇතුල්වෙන්ට පුළුවන් වන පිණිසත් තමුන්ගේ සළු සෝදගන්නාවූ තැනැත්තෝ ආශීර්වාද ලද්දෝය.

ලූක් 16 : 11

එබැවින් නුඹලා අධ්‍යාත්මික වස්තුව ගැන විශ්වාසව නොසිටියා නම්, සැබෑවූ වස්තුව නුඹලාට භාර දෙන්නේ කවුද?

2 කොරින්ති 8 : 9

මක්නිසාද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව එනම්, උන්වහන්සේ ධනවත්ව සිටිය නුමුත් තමන් වහන්සේගේ දිළිඳුකම කරණකොටගෙන නුඹලා ධනවන්ත වන පිණිස නුඹලා උදෙසා දිළිඳු වූ බව නුඹලා දන්නහුය.

යාකොබ් 2 : 5

මාගේ ප්‍රේමවන්ත සහෝදරයිනි, අසන්න: ඇදහිල්ලේ ධනවත් වන පිණිසත් තමන්වහන්සේට ප්‍රේම කරන්නවුන්ට පොරොන්දු වූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත් දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරා නොගත්සේක්ද?

එළිදරව් 2 : 9අ

මම නුඹේ පීඩාවද දිළිඳුකමද දනිමි (නුමුත් නුඹ ධනවත්ය..) . .

## භූමික ධනයේ ඇති භයානකත්වය

1 තිමෝති 6 : 17 – 19

මේ ලෝකයේ ධනවතුන් උඩඟු සිත් ඇත්තන් නොවී, වස්තුවේ අස්ථිරකම කෙරෙහි නොව, සියල්ල භුක්තිවිඳීමට අපට බහුල ලෙස දෙන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වී සිටින්ටත්, යහපත කරන්ටත්, උතුම් ක්‍රියාවලින් ධනවත් වෙන්ටත් ත්‍යාගිවන්තව බෙදදීමට ලැදිව සිටින්ටත්, සැබවින් ජීවනය වූ ඒ ජීවනය අල්ලාගන්නා පිණිස මතු කාලයට යහපත් අත්තිවාරමක් තබාගන්ටත් ආඥා කරන්න.

පිලිප්පි 3 : 21

සියලු දේ පවා තමන්ට යටත් කරන්ට පුළුවන්වූ බලය ලෙස, උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමාන වන පිණිස ඒවා වෙනස් කරනවා ඇත.

කොලොස්සි 1 : 12,13

ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුස්සන් කළා වූ පියාණන්වහන්සේට ස්තුති කරමින්ද, නුඹලා ස්වාමින්වහන්සේට ඔබින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන ලෙස ඉල්ලමුව. පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවා ගත්සේක.

ක්‍රියා 20 : 32

දෙවියන්වහන්සේටද නුඹලා ඉදි කරන්ටත්, පිරිසිදු සියල්ලන් අතරේ නුඹලාට උරුමයක් දෙන්ටත් හැකිවූ දෙවියන්වහන්සේගේ වචනයටද නුඹලා භාර දෙමි.

කොලොස්සි 3 : 4

අපේ ජීවනය වන ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ වන කල, නුඹලාත් උන්වහන්සේ සමග තේජසින් ප්‍රකාශ වන්නහුය.

එපීස 3 : 6 සහ 8

එනම්, ශුභාරංචිය කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ, අන්‍යජාතීන් හවුල් උරුමක්කාරයන් බවත් ශරීරයේ අවයවයන් බවත් පොරොන්දුවට හවුල්කාරයන් බවත්ය . . . සියලු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තා වූ මට මේ අනුග්‍රහය දෙන ලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන අන්‍යජාතීන්ට දේශනා කරන්නටය.

ගීතාවලිය 40 : 16

ඔබ සොයන සියල්ලෝ ඔබ කෙරෙහි සන්තෝෂ වෙත්වා, ප්‍රීතියට පැමිණෙත්වා. ඔබගේ ගැළවීමට ප්‍රියවන්නෝ, ස්වාමින්වහන්සේ උතුම් යයි නිතර කියත්වා.

ගීතාවලිය 32 : 11

ධර්මිෂ්ඨයෙනි, ස්වාමින් කෙරෙහි සතුටුව ප්‍රීතිවව්. අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති නාද කරව්.

පිලිප්පි 4 : 4

ස්වාමින්වහන්සේ තුළ නිතරම ප්‍රීති වෙන්න. ප්‍රීති වෙන්නැයි නැවතත් කියමි.

2 කොරින්ති 4 : 17අ, 18අ

මොහොතකට පවතින අපේ සැහැල්ලු දුක . . . ඉතාමත් වැඩි වශයෙන් සදකාල තේජස් භාරයක් සාදා දෙන්නේය.

සෙකරියා 9 : 9අ

සියොන් දියණියෙනි, බොහෝ සේ ප්‍රීතිමත් වෙන්න; යෙරුසලම් දියණියනි, ශබ්ද පවත්වන්න. බලව, නුඹේ රජ නුඹ වෙත එනසේක. උන්වහන්සේ ධර්මිෂ්ඨය, ගැළවීම ඇත්තාය. . .

ලූක් 10 : 20

එසේ වුවත්, ආත්මයන් නුඹලාට යටත් වන නිසා නොව නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීති වෙන්නැයි කීසේක.

ගිතාවලිය 5 : 11

ඔබව විශ්වාස කරන සියල්ලෝ සන්තෝෂ වෙත්වා, ඔබ ඔවුන් ආරක්ෂා කරන බැවින් සදකල් ප්‍රීති නාද කරත්වා. ඔබගේ නාමයට ප්‍රේම කරන්නෝ ඔබ කෙරෙහි ප්‍රීති වෙත්වා.

# උන්වහන්සේගේ කරුණාව සදාකාලයටම ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

නුමුත් මාගෙන් මුළාව යන්නා තමාගේම ප්‍රාණයට අනතුරු කරගන්නේය. මට වෛර වන සියල්ලෝම මරණයට ප්‍රේම වන්නෝය. —හිතෝපදේශ 8 : 36

කථා කරන තැනැන්වහන්සේ එපා නොකරන්ට බලාගනිත්වා. මක්නිසාද පොළොවේදී අවවාද කළ තැනැන්වහන්සේ එපා කළ විට ඔව්හු නොගැළවූ නම් ස්වර්ගයෙන් අවවාද කරන තැනැන්වහන්සේ කෙරෙන් අහක්ව ගිය විට අපි කෙසේ ගැළවෙමුද? — හෙබ්‍රෙව් 12 : 25

පටු දෙරකඩින් ඇතුල්වෙන්ට වීයසී කරන්න. මක්නිසාද, බොහෝ දෙනෙක් ඇතුල්වීමට සොයනාමුත් බැරි වෙන්නේයයි නුඹලාට කියමි. ගෙයි ස්වාමියා නැගිට දෙර වැසුවායින් පසු, නුඹලා පිටත සිට දෙරට තට්ටු කරන්ට පටන්ගෙන : ස්වාමිනි අපට දෙර ඇරිය මැනවයි කියන කල උන්වහන්සේ උත්තර දෙමින් : නුඹලා කොතැනින් ආවාද කියා නොදනිමියි, නුඹලාට කියනසේක. —ලූක් 13 : 24,25

## එපා කළ කරුණාව උදහසට හැරීමට පුළුවන

2 තෙසලෝනික 2 : 10 – 12

විනාශ වෙන්නන් අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලිවලින්ද යුක්තය. මක්නිසාද, ගැළවෙන පිණිස ඔවුහු සැබෑවේ ප්‍රේමය පිළිනොගත් හෙයිනි. මෙනිසා සැබෑව විශ්වාස නොකර, අධර්මිෂ්ඨකමට ප්‍රිය වූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස බොරුව විශ්වාස කිරීමට, මුළාවේ ක්‍රියාවක් දෙවියන්වහන්සේ ඔවුන්ට එවනසේක.

**පාපයෙන් පිරී වරදට පත්කර ඇත**

යොහන් 3 : 18

උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්වය කරනු නොලැබේ. අදහානොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහානොගෙන සිටින බැවින් දැනටම විනිශ්වය කරනු ලැබ සිටියි.

හෙබ්‍රෙව් 10 : 26,27 අ

මක්නිසාද, සැබෑව දැනගැනීමෙන් පසු, අපි කැමැත්තෙන්ම පව් කරමු නම්, විනිශ්වය ගැනත් . . . උදහස් ගින්න ගැනත් භයානක බලා සිටීමක් මිස, පව් ගැන තවත් පූජාවක් ඉතිරිව නොමැත.

**වචනය විසින් විනිශ්වය කරනු ලැබ**

යොහන් 12 : 48

මා එපා කොට මාගේ වචන පිළිනොගන්නාව විනිශ්වය කරන්නෙක් සිටියි. මා කී වචනයම අන්තිම දවසේදී ඔහුව විනිශ්වය කරන්නේය.

**ප්‍රේමකර සොයන ලදි**

1 යොහන් 4: 9

අප වෙත ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය එළිදරව් වෙන්නේ, උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයා තුළින් අප ජීවත්වන පිණිස උන්වහන්සේව ලොවට එවූ කරුණින්ය.

එළිදරව් 22 : 17

ආත්මයාණන්වහන්සේද, මනාලියද, එන්නැයි කියති. අසන්නාද එන්නැයි කියත්වා. පිපාසය ඇත්තාද එත්වා. කැමති කෙනෙක් ජීවන - පැන් නොමිලයේ ගනිත්වා.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ වචනයෙන් කිව නොහැකි සතුටින් විශ්වයේ සිංහාසනය සදකල්හිම බෙදගැනීමට හැකිව තිබියදී සාතන් සමග පීඩා විඳිමින් සදකාලය අපායේ ගත කිරීම මෝඩකමකි**

ගීතාවලිය 53 : 1අ

අඥානයා, දෙවි කෙනෙක් නැතැයි තම සිත තුළ කියා ගත්තේය.

ලූක් 11 : 39 40

ස්වාමින්වහන්සේ ඔහුට කියනසේක් : එරිසිවරුනි, නුඹලා කුසලානේද, තළියේද පිට පැත්ත පවිත්‍ර කරන්නෝය; නුමුත් නුඹලාගේ ඇතුල්පැත්ත කොල්ලකෑමෙන් හා දුෂ්ඨකමෙන් පිරී තිබේ. අඥානයෙනි, පිටපැත්ත සෑදූ තැනැන්වහන්සේ ඇතුල්-පැත්තත් නොසෑදූසේක්ද?

මතෙව් 7 : 26,27

යමෙක් මාගේ මේ වචන අසා, ඒවා පිළි නොපදීද, ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදගත් නුවණ නැති මනුෂ්‍යයෙකුට සමාන කරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා සුළඟ හමා, ඒ ගෙට ගැසුවේය; එය වැටුණි. එහි වැටීමද බලවත් විය.

යෙරෙමියා 17 : 11

අයුක්තියෙන් සම්පත උපදවා ගන්නා තමා නොදමූ බිජු රකින ඇටි කිකිළියෙකුට සමානය; ඔහුගේ දවස් මධ්‍යයේදී ඒවා ඔහු අත්හැර යන්නේය, මෙසේ ඔහු තම අවසානයේදී අඥානයෙක් වන්නේය.

**තේජසේ රජුව ප්‍රතික්ෂේප කරන සියලුදෙනම යා යුතු ස්ථානය**

හෙබ්‍රෙව් 6 : 8

නුමුත් කටුගස්ද ගොකටුද දරනවා නම් එපා කරනු ලැබ, ශාපයකට ළංව තිබේ; එහි කෙළවර දවනු ලැබීමය.

මතෙව් 13 : 41,42

මනුෂ්‍ය පුත්‍රයා තම දූතයන් එවනසේක. ඔව්හු බාධා උපදවන සියල්ලද අයුතුකම් කරන්නන්ද උන්වහන්සේගේ රාජ්‍යයෙන් එක්කොට, ගිනි උදුනෙහි හෙළන්නෝය. එහිදී හැඬීමද දත්මිටිකෑමද වන්නේය.

එළිදරව් 14 : 11

ඔවුන්ගේ වේදනාව නැමති ධූමය සදාකාලේටම නගින්නේය. මෘගයාටත් උගේ රූපයටත් නමස්කාර කරන්නෝද ඔහුගේ නාමයේ ලකුණ ලබන්නෝද දිවා රෑ දෙකේහි නිවාඩු නොලබන්නෝ යයි මහත් ශබ්දයකින් කීය.

පිලිප්පි 3 : 18අා 19අ

. . . බොහෝ දෙනෙක් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියට සතුරෝව හැසිරෙති. ඔවුන්ගේ කෙළවර විනාශයයි. . .

**අප අපායට යෑම වලක්වන පිණිස හාස්කම් කිරීමට දෙවියන්වහන්සේ පුල පුලා සිටිනසේක. එනම්: අප වෙනුවෙන් අපායට මුහුණ දීම; සදාකාල මරණය පරාජය කිරීම සහ උන්වහන්සේ තුළ අප මෙම ජය සොයා ජීවත්වන පිණිස නැවත නැගිටීමය. අනෙක නම්, කැරළිකාර පව්කරුවකුව, ක්‍රිස්තුස්වහන්සේ තුළ අළුත් ප්‍රෙමනීය සිතකට හැරවීමය.**

# රජුන්ගේ රජු කැමති සේ සාතන්ව සිරකරුවකු කරනසේක

එළිදරව් 20 : 1–3

පාතාලයේ යතුරුද අතේ මහත් දම්වැලක්ද ඇතුව දේවදූතයෙක් ස්වර්ගයෙන් බැස එනවා දුටිමි. ඔහු යක්ෂයා හා සාතන් වූ පුරාණ සර්පයා වන ඒ මහා සර්පයා අල්ලා අවුරුදු දහසක කෙළවර වන තුරු ඔහු විසින් ජාතීන් තවත් නොරවටන පිණිස ඔහු පාතාලයට හෙළා, එය වසා, ඔහු මතුයෙහි එය මුද්‍රා කළේය. ඉන්පසු ස්වල්ප කලකට ඔහු මුදනු ලබන්ට ඕනෑය.

එළිදරව් 20 : 7 සහ 10

අවුරුදු දහස කෙළවරවූ කල සාතන් තමාගේ හිරගෙයින් මුදනු ලැබ. . . ඔවුන් මුළා කළ යක්ෂයාව, මාගයාද, බොරු අනාගතවක්තෘ වෙසෙන, ගින්නෙන් හා ගෙන්දගමින්ද යුතු විලට හෙළනු ලැබුවේය. ඔව්හු සදහටම දිවා රෑ දෙකේම වධ කරනු ලබති.

**සාතන් කෙරෙහි සම්පූර්ණ සදාකාල ජය**

හෙබ්‍රෙව් 2 : 14

එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එම ආකාරයෙන් ඒවාට පංගුකාරයෙක් වූසේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇති යක්ෂයාව මරණය තුළින් විනාශ කිරීමටය.

# ඔබගේ සදාකාලික සේවය කාටද යන්න දැන්ම තීරණය කරන්න



මතෙව් 6 : 24

ස්වාමිවරු දෙදෙනෙකුට සේවය කිරීමට කිසිවෙකුට නුපුළුවන. මක්නිසාද ඔහු එක්කෙනෙකුට වෛර වී අනික් අයට ප්‍රිය වන්නේය; නොහොත් එක්කෙනෙකුට ඇලුම් වී අනික් අය හෙළා දකින්නේය. දෙවියන්වහන්සේට සහ වස්තුවට සේවය කිරීමට නුඹලාට නුපුළුවන.

ක්‍රියා 26 : 17ආ, 18

. . . මා තුළ ඇදහීමෙන් ඔවුන්ට පව් කමාවද පිරිසිදු කළ අය අතරේ උරුමයක්ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයටද, සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහද වන්නෙමි.

එළිදරව් 21 : 8

භය ඇත්තන්ටත් අවිශ්වාස කරන්නන්ටත් පිළිකුල්ව සිටින්නන්ටත් මිනී මරන්නන්ටත් වෛශ්‍යාකම් කරන්නන්ටත් මායාකාරයන්ටත් රූප වඳින්නන්ටත් සියලු බොරු කාරයන්ටත් ගින්නෙනුත් ගෙන්දගමිනුත් දැවෙන විලෙහි තම කොටස වන්නේය. එය දෙවෙනි මරණයයි.

යොහන් 8 : 34 – 36

යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : සැබවක් සැබවක් නුඹලාට කියමි, පව් කරන සියල්ලෝම පාපයාගේ වහල්ලුය. වහලා නිතරම ගෙදර නැවතී නොසිටියි. පුත්‍රයා නිතරම නැවතී සිටියි. එහෙයින් පුත්‍රයා නුඹලා නිදහස් කරන්නේ නම් සැබවින් නුඹලා නිදහස් වෙති.

# මා පා අසළින් ජීවන පැන් ගලයි

යොහන් 4 : 10

යේසුස්වහන්සේ ඇට උත්තර දෙමින්: දෙවියන්වහන්සේගේ දීමනාවත්, මට බොන්ට දෙන්නැයි නුඹට කීවේ කවුද කියාත් නුඹ දන්නෙහි නම්, නුඹ ඔහුගෙන් ඉල්ලනවා ඇත. එවිට ඔහු නුඹට ජීවනදයක වතුර දෙනවා ඇතැයි කීසේක.

යොහන් 7 : 37

මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දින යේසුස්වහන්සේ නැගිට ශබ්ද නගා: යමෙකුට පිපාසාය ඇත්නම් ඔහු මා ළඟට පැමිණ බීවාවේ කීසේක.

එළිදරව් 7 : 17

මක්නිසාද සිංහාසනය මැද සිටින බැටළු පැටවාණන් ඔවුන්ගේ එඬේරා වී, ජීවන දිය උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. දෙවියන්වහන්සේද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිස දමනසේකැයි කීවේය.

එළිදරව් 22 : 1 – 3

තවද, දෙවියන්වහන්සේගේද බැටළු-පැටවාණන්ගේද, සිංහාසනයෙන් නික්ම එන්නාවූ පළිඟු මෙන් දීප්තිමත්වූ ජීවන-දයක වතුර ඇති ගංගාවක්, එහි වීදිය මැද ඔහු මට පෙන්විය. ගංගාවේ මේ පැත්තේද ඒ පැත්තේද දොළොස් ආකාරයක ඵල දරන, මාස්පතා ඵල දෙන, ජීවන වෘක්ෂය තිබුණේය. ඒ වෘක්ෂයේ කොළ ජාතීන්ගේ සුවවීම පිණිසය. කිසි සාපයක් තවත් නොවන්නේය. එහි දෙවියන්වහන්සේගේද බැටළුවාණන්ගේද සිංහාසනය වන්නේය. උන්වහන්සේගේ මෙහෙකරුවෝ උන්-වහන්සේට මෙහෙකරන්නෝය.

# ඔබට මෙය අත්හැරුණද? මුළු සිතින් උන්වහන්සේව සොයන්න! 

මතෙව් 6 : 33

පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න; එවිට මේ සියල්ල නුඹලාට දෙනු ලැබේ.

ද්විතීය 4 : 29

නුඹලා නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ සොයමින් නුඹේ මුළු සිතෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද සොයන්නහු නම් උන්වහන්සේ නුඹට සම්භවනසේක.

හිතෝපදේශ 8 : 17

මට ප්‍රේම කරන්නන්ට මම ප්‍රේම කරමි; මා සොයන්නන්ට සම්භ වන්නෙමි.

ලූක් 11 : 9

මම නුඹලාට කියමි: ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ. සොයන්න, එවිට නුඹලාට සම්භවේ. තට්ටු කරන්න, එවිට නුඹලාට දෙර හරිනු ලැබේ.

හෙෂෙයා 10 : 12

ධර්මිෂ්ඨකම තුළ වපුරා කරුණාව තුළ කපාගන්න. පුරන් බිම කොටාගන්න. ස්වාමින්වහන්සේ පැමිණ නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු දන් උන්-වහන්සේ සෙවීමට කාලයයි.

යෙසායා 55 : 6

ස්වාමින්වහන්සේ සම්බවෙන්ට සිටිද්දී උන්වහන්සේ සොයා, උන්වහන්සේ ළංව සිටිද්දී උන්වහන්සේට යාඥා කරන්න.

ගීතාවලිය 86 : 12

මාගේ දෙවි වූ ස්වාමීනි, මාගේ මුළු සිතින් ඔබට ප්‍රශංසා කරන්නෙමි; ඔබගේ නාමයට සදකල්ම ගෞරව කරන්නෙමි.

# සරණ මංගලයය රාත්‍රිකෑම—දෙවියන්වහන්සේට මනාලියක් ලැබෙයි

එළිදරව් 21 : 9ආ, 10 සහ 22 — 24අ

. . . මෙහි එන්න, බැටළුපැටවාණන්ගේ භාර්යාව වන මනාලිය නුඹට පෙන්වන් නෙමියි කීවේය. ඔහු මහත් වූ උස්වූ කන්දකට ආත්මයාණන්ගේ ආනුභාවයෙන් මා ගෙන ගොස් ශුද්ධ නුවරවූ යෙරුසලම, දෙවියන්වහන්සේගේ තේජස ඇතුව දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බසිනවා මට පෙන්නුවේය. . . මම එහි දේව මාළිගාවක් නොදිටිමි. මක්නිසාද සර්ව පරාක්‍රම වූ දෙවියන්වහන්සේද, බැටළුපැටවාණෝද, එහි දේව මාළිගාව නිසාය. දෙවියන්වහන්සේගේ තේජසින් නුවර ආලෝකවූ බැවින්ද, බැටළුපැටවාණන් එහි පහන වන බැවින්ද, එය බැබළවීමට සූර්යයාවත් චන්ද්‍රයාවත් ඕනෑ නැත. ගැළවීම ලත් ජාතීහු එහි ආලෝකයේ ඇවිදිති. . . .

එළිදරව් 19 : 6ආ – 10අ

. . . සර්ව පරාක්‍රම වූ අපගේ දෙවිවූ ස්වාමින්වහන්සේ රජකම් කරන බැවින් හලෙලූයා; අපි අතිශයින් ප්‍රීති සන්තෝෂ වෙමු, උන්වහන්සේට ගෞරවය දෙමු. මක්නිසාද බැටළුපැටවාණන්ගේ සරණ මංගලයය පැමිණියේය, උන්වහන්සේගේ භාර්යාවද සූදානම්ව සිටින්නීය. දීප්තිමත් වූ පවිත්‍ර වූ සිහින් වස්ත්‍රයෙන් පැළඳෙන්ට ඈට ලැබුණේය. සිහින් වස්ත්‍ර නම් ශුද්ධවන්තයින්ගේ ධර්මිෂ්ඨ ක්‍රියාය. තවද බැටළුපැටවාණන්ගේ සරණ මංගලයය කෑමට හිඳවන ලද්දෝ වාසනාවන්තයෝය කියා ලියන්නැයි ඔහු මට කීවේය. මේවා දෙවියන්වහන්සේගේ සැබෑ වචනයයිද ඔහු මට කීවේය.

### උන්වහන්සේට යටත් වෙන්නාවූ

රෝම 6 : 13 ආ

නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන්වහන්සේට භාර වී. . . .

### මනාලයාට ප්‍රේම කරන

එපීස 6 : 24

අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවංක ව ප්‍රේම කරන්නාවූ සියල්ලන්ට අනුග්‍රහය වේවා.

### උන්වහන්සේ සමග එක්කෙනෙකි

එපීස 5 : 30

මක්නිසාද අපි උන්වහන්සේගේ ශරීරයේ අවයවයෝය.

2 පේත්‍රුස් 1 : 4ආ

. . . ඒ පොරොන්දු කරණකොටගෙන දේව සභාවට පංගුකාරයන් වන පිණිසය.

### දිව්‍ය බලෙන් පිරුණු

. . . පහ නොවන බලගතු ජීවිතයකට පත් කරනු ලැබූ . . . . —හෙබ්‍රෙව් 7 : 15 ආ

### දිව්‍ය ප්‍රේමයෙන් පිරුණු

යමෙක් උන්වහන්සේගේ වචනය පවත්වන්නේද ඔහු තුළ සැබෑවටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී තිබේ.

—1 යොහන් 2 : 5අ

### කැලැල් රහිත

මාගේ සොඳුරිය, නුඹ මුළුමනින්ම රුව ඇත්තීය. කැළලක් නැත්තීය

—සලමොන්ගේ ගීතිකා 4 : 7

ඉන් නිසා ප්‍රේම වන්තයෙනි, නුඹලා මේ දේවල් බලා සිටින බැවින් උන්වහන්සේ ඉදිරියෙහි කැලැල් රහිතව, නිදෙස්ව සමාදනයෙන් යුක්තව දකිනු ලබන පිණිස උත්සහ කරන්න. —2 පේත්‍රුස් 3 : 14

එළිදරව් 17 : 14

මොව්හු බැටළුපැටවාණන්ට විරුද්ධව යුද්ධ කරන්නෝය, බැටළුපැටවාණෝ ඔවුන් පරාජය කරනසේක. මක්නිසාද, උන්වහන්සේ ස්වාමින්ගේ ස්වාමින්ය, රජුන්ගේ රජය. උන්වහන්සේ සමඟ සිටින්නෝද කැඳවාගත් තෝරාගත් විශ්වාස තැනැත්තෝයයි කීවේය.

එළිදරව් 18 : 21

තවද බලවත් වූ දේව දූතයෙක් මහත් ඇඹරුම් ගලක් වැනි වූ ගලක් ගෙන මුහුදේ හෙළා : ඒ මහත් නුවර වූ බබිලෝනිය මහත් වැටීමකින් මෙසේ හෙළනු ලැබේ. තවත් කිසිසේත් සම්භනොවේ.

2 තෙසලෝනික 2 : 8

එවිට නොපනත්කම් කරන්නා එළිදරව් වන්නේය. ස්වාමිවූ යේසුස්වහන්සේ තමන්ගේ මුඛයේ හුස්මෙන් ඔහු නසා තමන්වහන්සේගේ ඊමේ ප්‍රකාශවීමෙන් නාස්ති කරනසේක.

සෙකරියා 14 : 12

යෙරුසලමට විරුධව යුද්ධයට ආවාවූ සියලුම ජනයන්ට ස්වාමින්වහන්සේ පමුණුවන පීඩාව මේය. ඔවුන් සිටගෙන සිටිද්දීම ඔවුන්ගේ මාංසය ක්ෂය වන්නේය. ඔවුන්ගේ ඇස් එහි සිදුරුවලම ක්ෂය වන්නේය. ඔවුන්ගේ දිවද ඔවුන්ගේ කටේම ක්ෂය වන්නේය.

1 කොරින්ති 15: 23 ආ, 24

එවිට කෙළවර පැමිණේ. උන්වහන්සේ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැති කළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාර දෙනසේක.

මතෙව් 6 : 10

ඔබගේ රාජ්‍ය ඒවා ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවේද කරනු ලැබේවා.

එළිදරව් 11 : 15ආ

. . . ලෝකයේ අධිපතිකම අප ස්වාමින්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම් කරනසේක.

එළිදරව් 5 : 9 ආ, 10

. . . මක්නිසාද ඔබ මරනු ලැබ, සියලු ගෝත්‍රවලින්ද භාෂාවන්ගෙන්ද සෙනගගෙන්ද ජාතීන්ගෙන්ද මිනිසුන් ඔබගේ ලෙයින් දෙවියන්වහන්සේට මිලේට ගෙන ඔවුන් අපගේ දෙවියන්වහන්සේට පූජක රාජ්‍යයක් කළසේක. ඔව්හු පොළොවෙහි රජකම් කරතියි කීවෝය.

එළිදරව් 20 : 4ආ

. . . තවද යේසුස්වහන්සේගේ සාක්ෂිය නිසාද දෙවියන්වහන්සේගේ වචනය නිසාද හිස් ගසා දැමූ අයගේද, මෘගයාටවත් උගේ රූපයටවත් නමස්කාර නොකළාවූ උගේ සළකුණ තමුන්ගේ නළල්වලත් අත්වලත් නොලැබූ තැනැත්තන්ගේද ආත්මයන් දුටිමි; ඔව්හු ජීවත්ව ක්‍රිස්තුස්වහන්සේ සමග අවුරුදු දහසක් රජකම් කළෝය.

එළිදරව් 20 : 6

පළමු නැවත නැගිටීමට පංගුකාරකම ඇති තැනැත්තා වාසනාවන්තය, ශුද්ධය. ඔවුන් කෙරෙහි දෙවෙනි මරණයට බලය නැත්තේය. ඔවුහු දෙවියන්වහන්සේගේත් ක්‍රිස්තුස්වහන්සේගේත් පූජකයෝව උන්වහන්සේ හා සමග අවුරුදු දහසක් රජකම් කරන්නෝය.

**මම දෙවියන්වහන්සේ සමග සදහටම ජීවත්වෙමි. අහෝ, මොන ප්‍රීතියක්ද!**

ගීතාවලිය 145 : 1

මා දෙවි වූ රජ ඔබ උසස් කරමි. ඔබේ නාමයට සදහටම ප්‍රසංසා කරමි.

යොහන් 17 : 24 අ

පියාණෙනි, ඔබ මට දුන් මහිමය ඔබ මට දුන්නාවුන් විසිනුත් දක්නා පිණිස මා සිටින තැන ඔවුනුත් මා සමග සිටිනවාට කැමැත්තෙමි. . . .

1 තෙසලෝනික 16 ආ, 17

ක්‍රිස්තුස්වහන්සේ තුළ මළවුන් පළමුව නැගිටිති. ජීවත්ව, ඉතිරිවූ අපි ඔවුන් සමග ස්වාමින්වහන්සේ මුණගැසීමට වළාකුල්-වලින් අහසට ඇදගනු ලැබේ. මෙසේ අපි සදහටම ස්වාමින්වහන්සේ සමග සිටිමු.

එළිදරව් 21 : 3,4

මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමගය. උන්වහන්සේඔවුන් හා වාසය කරනසේක, ඔව්හු උන්වහන්සේගේ සෙනග වෙති. දෙවියන්වහන්සේ ඔවුන් හා සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වනසේක. දෙවියන්වහන්සේ ඔවුන්ගේ නෙත්වලින් සියළු කඳුළු පිසිනසේක. මරණයද, වැළපීමද, හැඬීමද, වේදනාවද, තවත් නැත: මක්නිසාද පළමු දෙය පහව ගොස් ඇත.

එළිදරව් 22 : 5

එහි රාත්‍රියක් තවත් නොවන්නේය. පහන් ආලෝකයවත් සූර්යාලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත. මක්නිසාද ස්වාමිවූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙනසේක. ඔව්හු සදකාලේටම රජකම් කරන්නෝය.

# ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පවසති

මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ සමග උන්වහන්සේගේ සිංහාසනයේ හිඳගත් සේම, ජයගන්නාට මාගේ සිංහාසනයෙහි මා සමග හිඳගන්නට දෙන්නෙමි.

එළිදරව් 3: 21

ක්‍රිස්තුස්වහන්සේ තුළ ශ්‍රේෂ්ඨත්වයට මා මවා තිබේ!
සර්ව සම්පූර්ණ උන්වහන්සේ මා කැඳවනසේක!
ඉතින් මා යා යුතුයි, ඔව්! ජයෙන් ජයට යා යුතුයි!

Read booklets online or by App
www.wmp-readonline.org

www.wmpress.org 10-21 502 Sinhala WAI